# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2053/29 - 2018 ජනවාරි මස 10 වැනි බදාදා - 2018.01.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය : KDS/MDB/4/2/1/79/12.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 13/97/FR/327.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය, පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

නකල්ස් රක්ෂිතය සඳහා ඉඩම් අත්කර ගැනීම:

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩසියපත්තුව කෝරළේ සුළු කොට්ඨාසයේ මාංගොඩ (806) ග්‍රාම නිලධාරී වසමේ මාංගොඩ ගමේ පිහිටි, මහනුවර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ මූලික පිඹුරු අංක මහ 6734 හා 2017.09.08 දිනැති පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.8448 ක් වූ කන්දේ වත්ත නැමැති ඉඩම්.

1. කැබලි අංක 01

ඉඩමේ නම: කන්දේවත්ත; ඉඩමේ විස්තරය: ලඳු කැළය; හිමිකම් කියන අය: මාංගොඩ මැදමහනුවර පදිංචි වයි. එම්. මුතුමැණිකා, වයි. එම්. හින් බණ්ඩා, වයි. එම්. අබේරත්න; ප්‍රමාණය: හෙක්: 2.8448.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් 2018 පෙබරවාරි මස 28 වැනි දින ප.ව. 2.00ට මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 පෙබරවාරි මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඒ. එම්. වික්‍රමාරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
මැදදුම්බර.

2017 දෙසැම්බර් මස 28 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01- 689

1A - G 26921 - 74 (2018/01)
මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නිවැරදි කිරීමයි

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දන්වීම

2016.12.05 වැනි දින පළවූ අංක 1996/3 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ සඳහන් වූ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පරබෑවිල සහ කොරදෙළුව ගම්වල පිහිටි මු.පි.අ කු 2343, හි KU/PLG/2016/626 අංකය යටතේ වූ කැබලි අංක 128 පහත සඳහන් ලෙස සංශෝධනය විය යුතුය.

1. **කැබලි අංක 138**

ඉඩමේ නම: කොස්උල්ලේවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: හේරත් මුදියන්සේලාගේ ප්‍රේමදස බණ්ඩා; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0379.

2. **කැබලි අංක 139**

ඉඩමේ නම: කොස්උල්ලේවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සතුරුසිංහ ආරච්චිල්ලාගේ කමලා පද්මලතා කුමාරි; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0474.

ඩී. අනෝමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
පොල්ගහවෙල.

2017 නොවැම්බර් මස 29 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01 - 690

## ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි.

*මගේ අංකය* : ටීඑච්අයි/එල්එන්ඩී/එල්2/ඒසීකිවුවීඅයි/132.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/6/2015/එච්ඩබ්ලිව්/267.

තිහගොඩ ප්‍රාදේශීය ලේකම් උමේෂා සුරංගි මාතරගේ වන මම, දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ අතුරු මාර්ග ඉදිකිරීමට අදාළව නිකුත් කරන ලද 2017.11.20 දිනැති අංක 2046/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි 6ඒ පිටුවෙහි ප්‍රකාශයට පත් කරන ලද 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තිය යටතේ *ගැසට්* නිවේදනයේ සඳහන් වන්දි පරීක්ෂණ දිනය 2018.01.22 වැනි දින ලෙස සංශෝධනය කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

උමේෂා සුරංගී මාතරගේ,
ප්‍රාදේශීය ලේකම්,
තිහගොඩ.

2018 ජනවාරි මස 03 වැනි දින,
තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01 - 691

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.